# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර : ඉංජිනේරු (සිවිල්), ඉංජිනේරු (විදුලි), ඉංජිනේරු (යාන්ත්‍රික / නාවික)- කොන්ත්‍රාත් පදනම**

අ) **වැටුප :** දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 135,000/= ක් පමණ වේ.

ආ) **යෝග්‍යතාවය :** පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාවේදී (සිවිල්/ විදුලි/ යාන්ත්‍රික) උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ලබාගත් ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම.

**සටහන :** ඉංජිනේරු තනතුර සඳහා ආශ්‍රිත ඉංජිනේරු කාණ්ඩය (A.Eng.) හෝ ඊට ඉහළ කාණ්ඩයක් යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ (ECSL) හි ලියාපදිංචිය අනිවාර්ය වේ.

**වයස් සීමාව :** වයස අවුරුදු 45ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි.)

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග **ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, මානව සම්පත් කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13** යන ලිපිනයට ලැබෙන සේ 2022-11-04 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් (slpahrex@slpa.lk) එවිය යුතුයි. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ /සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු / සංස්ථා සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති.**